**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමේ අපරාධයට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.12.14 වන දින මීගොඩ පොලිස් වසමේ නාගහවත්ත ප්‍රදේශයේදී කාර් රථයකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධව මීගොඩ පොලිස් ස්ථානය හා බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය විසින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2024.12.19 වන දින මෙම අපරාධයට සම්බන්ධ වෙඩික්කරු ලෙස කටයුතු කල සැකකරුවෙකු හා එයට ආධාර අනුබල දුන් තවත් සැකකරුවෙකු අත්අඩංගුවට ගන්නා ලදී.

එම සැකකරුවන්ගෙන් සිදු කරන ලද ප්‍රශ්න කිරීමේදී, මෙම අපරාධයට සම්බන්ධ තවත් සැකකරුවන් තිදෙනෙකු 2024.12.22 වන දින සවස් කාලයේ හෝමාගම හා මීගොඩ පොලිස් වසම් වලදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22, 26 හා 38 යන වයස්වල පසුවන පාදුක්ක හා මීගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මොවුන්ගෙන් එක් අයෙකු මෙම අපරාධය සිදුකිරීමට වෙඩික්කරු සමඟ පැමිණි පුද්ගලයෙකු වන අතර අනෙක් පුද්ගලයින් දෙදෙනා අපරාධය සිදුකිරීමට ආධාර අනුබල දීම හා කුමන්ත්‍රණය කිරීම යන චෝදනා මත අත්අඩංගුවට ගෙන ඇත.

බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය හා මීගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. දුරකථනයෙන් මරණ තර්ජන එල්ල කර කාන්තාවකගෙන් කප්පම් මුදලක් ඉල්ලීමේ අපරාධයට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2024.12.04 වන දින කැලණිය පොලිස් වසමේ දිප්පිටිගොඩ ප්‍රදේශයේ කාන්තාවකගෙන් විදේශ රටක සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු විසින් පුද්ගලයින් යොදවා දුරකථනයෙන් මරණ තර්ජනය එල්ල කර රුපියල් ලක්ෂ 10 ක කප්පම් මුදලක් ඉල්ලීමේ අපරාධය සම්බන්ධයෙන් බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය විසින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව මෙම අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු 2024.12.22 වන දින උදෑසන කාලයේදී කිරිබත්ගොඩ පොලිස් වසමේ දළුගම

ප්‍රදේශයේදී හා පැලියගොඩ පොලිස් වසමේ පට්ටිය හන්දිය ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 35 හා 53 යන වයස්වල පසුවන කැලණිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.12.22 වන දින සවස් කාලයේ ගම්පහ පොලිස් වසමේ බොටුවාදෙණිය ප්‍රදේශයේදී ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 30 මිලිග්‍රෑම් 126 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගම්පහ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන මාකෙවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නුගේගොඩ කොට්ඨාස දූෂණ මර්ධන අංශය.

2024.12.22 වන දින මහරගම පොලිස් වසමේ ජනතා පොළ අසලදී නුගේගොඩ කොට්ඨාස දූෂණ මර්ධන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 490 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මහරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන ගොඩිගමුව, මහරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කටුනායක පොලිස් ස්ථානය.

2024.12.22 වන දින රාත්‍රී කාලයේ කටුනායක පොලිස් වසමේ මල්ගස් හන්දිය ප්‍රදේශයේදී කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 250 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන මාදුව, කටුනායක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කටුනායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06.** **අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකාරියක් හා සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.12.22 වන දින දහවල් කාලයේ දෙමටගොඩ පොලිස් වසමේ ලක්හිරු සෙවන ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 20 මිලිග්‍රෑම් 450 ක් හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 34,500/= ක් සමග සැකකාරියක් හා හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 160 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරු දු 36 ක් වන අතර සැකකරු වයස අවුරුදු 39 ක් වන මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.12.22 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ගොළු මඩම හන්දිය ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08.** **නීති විරෝධී ලෙස වගා කරන ලද ගංජා හේන් 08 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.12.22 වන දින සවස් කාලයේදී ගෝනගංආර පොලිස් වසමේ යාල රක්ෂිත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දින 05 ක් පුරා සිදු කරන ලද වැටලීමකදී නීති විරෝධී ලෙස වගා කරන ලද ගංජා හේන් 08 ක ගංජා ගස් 1130000 කට අධික ප්‍රමාණයක් සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ගෝනගංආර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 47 හා 51 යන වයස්වල පසුවන මහඔය හා වලස්මුල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා ගංජා හේන් දෙකක සැකකරුවන් වන අතර අනෙක් ගංජා හේන් 06 හි සැකකරුවන් මෙතෙක් අනාවරණය වී නොමැත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ගෝනගංආර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09.** **විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - ගල්කිරියාගම පොලිස් වසම.**

2024.12.22 වන දින උදෑසන කාලයේ ගල්කිරියාගම පොලිස් වසමේ පැල්බැදියාව ප්‍රදේශයේදී පුද්ගලයෙකුට විදුලි සැර වැදී මියගොස් ඇති බවට ගල්කිරියාගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ ගල්පාය, දේවහුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කුඹුරු යායක් වන අලින්ගෙන් ආරක්ෂා කිරීම සඳහා අනවසරෙන් ඇද තිබූ විදුලි රැහැනක ගැටී විදුලි සැර වැදීමෙන් මෙම මරණය සිදුව ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. අනවසර විදුලි රැහැන ඇද තිබූ කුඹුරු ඉඩමේ අයිතිකරු අත්අඩංගුවට ගෙන ඇත.

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ගල්කිරියාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. වන අලි ප්‍රහාරයකින් පුද්ගලයෙකු මියයාම - බකමූණ පොලිස් වසම.

2024.12.22 වන දින අළුයම් කාලයේ දී බකමූණ පොලිස් වසමේ බුදුරුවයාය ප්‍රදේශයේදී වන අලියෙකු පහරදීම හේතුවෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට බකමූණ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් වූ බුදුරුවයාය, බකමූණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු නිවස ඉදිරිපිටදී මෙම වන අලි ප්‍රහාරයට ලක්ව ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය විය.

මෘත ශරීරය හදිසි මරණ පරීක්ෂණය සිදුකර ඥාතීන්ට භාර දී ඇත. බකමූණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. දුම්රියක ගැටී පාසල් සිසුවියක් හා කාන්තාවක් මියයාම - අනුරාධපුර පොලිස් වසම.

2024.12.22 වන දින සවස් කාලයේ අනුරාධපුරය පොලිස් වසමේ නව නගරය දුම්රිය ස්ථානය ආසන්නයේදී කන්කසන්තුරය සිට කොළඹ බලා ධාවනය වූ සීඝ්‍රගාමී දුම්රියේ ගැටී පාසල් සිසුවියක් හා කාන්තාවක් මියගොස් ඇති බවට අනුරාධපුර පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරියන් අවුරුදු 18 හා 37 යන වයස්වල පසු වූ ශ්‍රී පලාබද්දල, රත්නපුරය ප්‍රදේශයේ පදිංචිකාරියන් වේ.**

අනුරාධපුර මහජන ක්‍රීඩාංගනයේ පැවැති ටයිකොණ්ඩෝ ක්‍රීඩා තරඟාවලියකට සහභාගි වීම සඳහා මොවුන් රත්නපුර ප්‍රදේශයේ සිට පැමිණි පාසල් සිසුවියක් සහ තවත් පාසල් සිසුවියකගේ මවක් බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වි ඇත.
මෘත ශරීර අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. නිදන් සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - කහටගස්දිගිලිය පොලිස් ස්ථානය.

2024.12.22 වන දින උදෑසන කාලයේ කහටගස්දිගිලිය පොලිස් වසමේ නෙකුටුනුවැව ප්‍රදේශයේදී කහටගස්දිගිලිය පොලිස් ස්ථානයේ නිලධාරීන්

කණ්ඩායමක් විසින් වැටලීමක් සිදු කර **නිදන් සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු කැණීම් උපකරණ ද සමගින්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන යාය 04, අරලගංවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු තවත් සැකකරුවන් සිව් දෙනෙකු සමඟ මෙම කැණීම් කටයුතු සිදුකර ඇති අතර වැටලීම සිදුකරන අවස්ථාවේදී සැකකරුවන් සිව් දෙනා පලාගොස් ඇත. පලා ගිය සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කහටගස්දිගිලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 13. හදිසි ගින්නක් - මන්දාරම්නුවර පොලිස් වසම.

2024.07.22 වන දින දහවල් කාලයේ මන්දාරම්නුවර පොලිස් වසමේ එළමලේ ප්‍රදේශයේ පිහිටි ලැයිම් කාමර 20 කින් සමන්විත නිවාස පෙළක හදිසි ගින්නක් හටගෙන ඇති බවට මන්දාරම්නුවර පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත වහාම ක්‍රියාත්මක වූ පොලිසිය, ප්‍රදේශවාසීන්ගේ සහාය ඇතිව ගින්න මැඩපවත්වා ඇත.

ගින්න ඇති වීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. ගින්නෙන් ලැයිමේ කාමර 02 ක් සම්පූර්ණයෙන් විනාශ වී ඇති අතර කාමර 03 ක් අර්ධ වශයෙන් විනාශ වී ඇත. ගින්න හේතුවෙන් ජීවිත හානි සිදුව නොමැති අතර මෙම සිද්ධියෙන් අවතැන් වූ පුද්ගලයින් 79 දෙනෙකු පාසලක ආරක්ෂිතව නවාතැන් ගැනීමට කටයුතු කර ඇත.

මන්දාරම්නුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - මදුරාගොඩ පොලිස් වසම.

2024.12.22 වන දින උදෑසන කාලයේ මදුරාගොඩ පොලිස් වසමේ මාතලේ කුරුණෑගල මාර්ගයේ ලෝඩන් ප්‍රදේශයේදී දොඩම්ගස්ලන්ද දෙස සිට මාතලේ දෙසට ධාවනය වූ වෑන් රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන මීටර් 40 ක් පමණ ප්‍රපාතයකට පෙරලී අනතුරක් සිදුව ඇත. අනතුරින් වෑන් රථයේ රියදුරු හා එහි ගමන් ගත් කාන්තාවන් තිදෙනෙකු බරපතල තුවාල ලබා යටවත්ත රෝහලට ඇතුලත් කිරීමේදි වෑන් රථයේ රියදුරු මියගොස් ඇත. තුවාල ලැබූ කාන්තාවන් තිදෙනා වැඩිදුර ප්‍රතිකාර සඳහා මාතලේ රෝහලට මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ක් වූ දූම්කොළවත්ත, මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. මදුරාගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - ඉමදූව පොලිස් වසම.

2024.12.22 වන දින සවස් කාලයේ ඉමදූව පොලිස් වසමේ ඉමදූව අහංගම මාර්ගයේ දික්කුඹුර ප්‍රදේශයේදී අහංගම දෙස සිට ඉමදූව දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු හා එහි පසුපස අසුනේ ගමන්

කළ පුද්ගලයින් සිව්දෙනෙකු තුවාල ලබා අහංගම රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී ත්‍රීරෝද රථ රියදුරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ ගොන්නගහහේන, අහංගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අහංගම රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර ලොරි රථ රියදුරු අඩංගුවට ගෙන ඇත. ඉමදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**